# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,655 — 1959 ජනවාරි 30 වැනි සිකුරාදා—30.1.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (II) වැනි ඡේදය—පලකිරීම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... | — | තොටුපළ රේන්ද හා වෙනත් රේන්ද විකිණීම | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | 245 | ආණ්ඩුවේ නොවක දැන්වීම් ... ... | — |
| ටැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... | 245 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් | — |
| තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | — | විවිධ දැන්වීම් ... ... | — |


## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### රජයේ ලලිත කලායතනය

**1959 ජූනි 18 වැනි දින සිට ඇරඹෙන 1959-60 අධ්‍යයන වර්ෂය සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇතුළුකර ගැනීම**

ඇඳීම හා පින්තාරු කිරීම, රූප නෙළීම, කලාශිල්ප, උතුරු ඉන්දිය සංගීත කලාව සහ උඩරට නාට්‍යකලාව යනාදි වශයෙන් එක් එක් අංශයේ පාඨමාලාවන් සඳහා ඇතුළත්වීමේ අයැදුම් පත් 1959 මාර්තු 31 වැනි ද දක්වා භාරගනු ලැබේ. එදිනට පසුව ලැබෙන අයැදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ඇත. මෙම අයැදුම් පත් පුරවා එවිය යුත්තේ නියමිත ආකෘති පත්‍රයෙහි ය. එම ආකෘති පත්‍ර හා පන්ති පිළිබඳ විස්තර පත්‍රිකා 1959 මාර්තු මස 1 වැනි ද සිට 31 වැනි ද දක්වා රජයේ ලලිත කලායතනයේ, හෝර්ටන් පෙදෙසේ, කොළඹ 7 පිහිටි කාර්යාලයෙන් ලබාගත හැක.

දැනට ආකෘති පත්‍ර යනාදිය ඉල්ලා ලියා එවා ඇති අයට මාර්තු මාසයෙහිදී ඒවා ලැබෙන්නට සලස්වන හෙයින්, ඊට කලින් වෙනම පිළිතුරු නොඑවනු ඇත. එක පාඨමාලාවකට වැඩි ගණනක් සඳහා උවද ඉල්ලුම් පත්‍ර එවීමට අයැදුම්කරුවෙකුට බාධාවක් නැති නමුත්, එක් එක් පාඨමාලාව සඳහා වෙන වෙනම අයැදුම් පත බැගින් එවිය යුතු වේ.

ඩේවිඩ් පේන්ටර්,
වැඩ බලන විද්‍යාලයාධිපති.

1959. 1. 26,
කොළඹ 7,
හෝර්ටන් පෙදෙස,
රජයේ ලලිත කලායතනය,

## ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

### ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය තැ. පෙ. 500, කොළඹ 1) අලවංගු සැපයීම සඳහා 1959 මාර්තු 10 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 50ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1959 මාර්තු 9 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ලු. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1959 ජනවාරි 30 වැනි දින,
කොළඹදීය.

15. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නාම සමග හෝ නාම ඇතුළත් වූ හෝ තමාට සෑහේ යයි පෙනීයන හේතුපිට කෘෂිකර්ම අධ්‍යක්ෂක තැන විරුද්ධ වන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

16. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිලගණන් යටත් පිරිසෙයින් සති 3 කටවත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුය.

17. වැඩි විස්තර කන්තලේ උක්වගාව පිළිබඳ සාමාන්‍යාධිකාරි තැනගෙන් ලබාගත හැකිය.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1959 ජනවාරි 16,
පේරාදෙනිය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පොල් විකිණීම

වාරියපොල, කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක භාර පරිපාලන නිලධාරිතැන විසින් බතලගොඩ ආණ්ඩුවේ ගොවිපලෙහි ඇති පොල් 24,000ක් පමණ විකිණීම සඳහා සීල් තබනලද ටෙන්ඩර් පත්‍ර 1959 පෙබරවාරි මස 20 වෙනි දින පස්වරු 2.30 වනතුරු භාරගනු ලැබේ.

2. කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක භාර පරිපාලන නිලධාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියළුම ටෙන්ඩර්පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා "කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක භාර පරිපාලන නිලධාරි තැන, කෘෂිකර්ම කායාංශලය, වාරියපොල" යන්න එහි පිට ලියා එහි මුදුනේ වම් කොනෙහි "බතලගොඩ ආණ්ඩුවේ ගොවිපොලේ පොල් සඳහා ටෙන්ඩර්" යන්න සඳහන් කළ යුතුයි. සියළුම ටෙන්ඩර්පත්‍ර අනුපිටපතක්ද සහිතව සීල් තබන ලද කවරය තුළ බහා ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචිකළ තැපෑලෙන් නො එවතොත් ටෙන්ඩර්කරුවන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක භාර පරිපාලන නිලධාරිතැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයේ "බතලගොඩ ආණ්ඩුවේ ගොවිපලෙහි පොල් සඳහා ටෙන්ඩර්" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුය.

4. ලියාපදිංචි කළ තැපෑලෙන් එවනලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියළුම ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින 4ක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණ හොත් ඔහු කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක භාර පරිපාලන නිලධාරිතැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරණු ලබන්නේ පොල් සඳහා ටෙන්ඩර්පත්‍රය වෙනුවෙන් රුපියල් 25ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළයුතුයි. පත් කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් දින දහයක් ඇතුළත මුළු පොල් තොගයටම සම්පූර්ණ මුදල් ගෙවා ඒවා ඉවත් කරගත යුතුයි. එසේ නොකැකිවුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නට ඉඩ තිබේ.

6. නියමිත ෆෝරමයේ ලියා නැති නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළයුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුවේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂප කිරීමේත් ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂක වෙත තබාගනී.

9. පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවාගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක්ය යන්නයි.

10. 1934ථ 19 වැනි අංකය දරණ කම්කරු ආඥපණත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ලද ඉල්ලුම්පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

11. කොන්ත්‍රාත්කාරයාට භාරදිය යුතු සියළු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත්, නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් ඔහු අතටම භාර දුන්නා කොට සැලකිය යුතුයි.

12. වැඩට ගැණීමට නුසුදුසු යයි කල්පනාකරනු ලබන යම්කිසි කම් කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

13. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නාම සමග හෝ නම ඇතුළත්වූ හෝ තමාට සෑහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂතැන විරුඩවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

14. ටෙන්ඩර්පත්‍රයේ සඳහන් කරනු ලබන මිල ගණන් යටත් පිරිසෙයින් සති 3කටවත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

15. පිළිගත් ටෙන්ඩර්කරු ඔහුගේ ටෙන්ඩරය භාරගත් බව දන්වන ලිපිය ලැබී දින 10ක් ඇතුළත, පොල් වලට ගෙවා ඉවත් කර ගත යුතුයි.

16. පිළිගත් ටෙන්ඩර්කරු පොල් සියල්ලටම සම්පූර්ණ මුදල ගෙවා ඉවත් කරගත යුතුයි. පොල් තෝරා ඉන් සමහරක් ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ දෙනු නොලැබේ.

17. මේ පිළිබඳ වැඩි විස්තර බතලගොඩ ආණ්ඩුවේ ගොවිපල භාර කළමනාකාරතැනගෙන් දැනගත හැක.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂතැන.

1959 ජනවාරි 21 වෙනි දින
පේරාදෙණියේ දීය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ගොවිපලවලට රසායනික පෝර වර්ග සැපයීම

පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් රජයේ ගබඩාස්ථාන සහ කෘෂිකර්ම ගොවිපලවලට පහත සඳහන් රසායනික පෝර වර්ග සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ, යූනියන් පෙදෙසේ පිහිටි කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, 1959 පෙබරවාරි මස 20 වැනි දින පස්වරු 2.30 වනතෙක් භාර ගනු ලැබේ. රේගු ගාස්තු සහිතව මුළු බර ප්‍රමාණය අනුව පෝර ටොන් එකකට අය කරන මිල ටෙන්ඩර් කරුවන් විසින් සඳහන් කළ යුතුයි.

| රසායනික පෝර වර්ග | උවමනා කරන සාමාන්‍ය ප්‍රමාණය හොණ්ඩර |
|---|---|
| ඇමෝනියම් සල්ෆේට් ... | ... 6,890 |
| සුපර් ෆොස්ෆේට් (සාන්ද්‍ර) ... | ... 2,440 |
| පොටෑෂ් සල්ෆේට් ... | ... 435 |
| රොක් ෆොස්ෆේට් ... | ... 2,250 |
| පොටෑෂ් මියුරියේට් (60% ශ්‍රෙණිය) | ... 1,900 |
| කැල්සියම් සයින මයිඩ් ... | ... 360 |
| ඇමෝෆොස් ... | ... 70 |
| ලේ පෝර ... | ... 75 |
| බේසික් ස්ලැග් ... | ... 255 |
| විෂ බීජ නසන ලද කටු පෝර ... | ... 10 |
| යූරියා ... | ... 350 |
| දිය ගැසූ කොරල් හුණු ... | ... 310 |
| කුඩු කරන ලද කොරල් හුණු ... | ... 4,400 |
| කුඩු කරන ලද හුණු ගල් ... | ... 615 |

2. ඉහත සඳහන් වන්නේ 1959 අප්‍රේල් මස 1 වැනි දින සිට හය මාසයකට උවමනා වන ප්‍රමාණයයි.

3. රසායනික පෝර වර්ග පහත දැක්වෙන අවම රසායනික සම්මිශ්‍රණයන්ගෙන් යුක්ත විය යුතුවාක් මෙන්ම උපද්‍රවදායක ද්‍රව්‍යයන්ගෙන් තොරවිය යුතුයි. එක් එක් රසායනික පෝර වර්ගයේ අඩුම රසායනික සම්මිශ්‍රණයන් පැහැදිලි ලෙස සඳහන් කළ යුතුයි.

ඔහු එසේ දන්වන තුරු ඒ සියලු ලියුම්, දැන්වීම් හෝ සෙසු ලියකියවිලි පොරොන්දු පත්‍රයේ සඳහන් ලිපිනයට යැව්වොත් ඒ යැවීම සියලු කටයුතු සම්බන්ධයෙන් ඒවා සෑහෙන පමණ හොඳින් ඔහුට භාර දීමම කොට සැලකිය යුතුයි.

24. වැඩට ගැනීමට නුසුදුසු යැයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත් කරුවා වැඩට ගැනීමගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුවට තබා ගනු ලැබේ.

25. දෙපාර්තමේන්තුවේ යහපත සඳහා කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනට ඉහත සඳහන් රසායනික පෝර සියල්ලම මිලට නොගත යුතුයැයි පෙනී ගිය හොත් එසේ මිලට නොගැනීම හේතුකොට ගෙන ආණ්ඩුවෙන් වන්දි මුදලක් ගැනීමට බලයක් කොන්ත්‍රාත් කරුවාට නොලැබේ.

26. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනිතනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුළත්වූ හෝ තමාට සෑහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

27. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ඇප කරුවන් දෙදෙනෙකු සොයා ගෙන ඔහුගේ වියදමින්ම ඔවුන් ලවා පොරොන්දු ඔප්පුවක් අත්සන් කරවා ගත යුතුයි.

28. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලු මිල ගණන් යටත් පිරිසෙයින් මාස 2 කට වත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

29. සපයන ලද රසායනික පෝර වගී සතුටුදායක නොවීමත්, කොන්ත්‍රාත්තුවේ කොන්දේසි ඉටු නොකිරීමත් නිසා කොන්ත්‍රාත්තුව නතර කිරීමේ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනට තබා ගනු ලැබේ.

30. වැඩි විස්තර පේරාදෙනියේ; කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගෙන් දැනගත හැකිය. එසේ විස්තර අසා එවන ලියුම් පහත සඳහන් අය ගේ පුද්ගලික නමට නොඑවිය යුතුයි.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ

1959 ජනවාරි මස 23 දින,
පේරාදෙණියේ දීය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ප්‍රධාන ලිපිකරුගේ නිවාසය තැනීම

පොලොන්නරුවේ ඊශාන දිශාව භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින්, පොලොන්නරුව නව නගරයේ, ප්‍රධාන ලිපිකරුගේ නිවාසය තැනීම සඳහා 1959ක් වූ පෙබරවාරි මස 11 වැනි බදාදා පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. පොලොන්නරුවේ වාරිමාර්ග කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල පිළියෙල කරනු ලද ටෙන්ඩර් පත්‍ර දෙක බැගින් මුද්‍රා තැබූ කවරවල බහා ඉදිරිපත් කළ යුතුයි. සැලැස්ම හා වැඩ පිළිබඳ විස්තර පොලොන්නරුව වාරිමාර්ග කාර්යාලයෙන් ලබාගත හැක.

3. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 30,000කට හෝ ඊට වැඩි මුදලකට ලියා පදිංචි වී ඇති, රුපියල් 50 ක් කච්චේරියේ හෝ මෙම කාර්යාලයේ තැන්පත් කළ බැව් පෙන්වා සිටින කොන්ත්‍රාත් කරුවන්ට, 1959 ජනවාරි මස 30 වැනි දින සිට 1959 පෙබරවාරි මස 9 වැනි දින දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරණු ලැබේ.

4. දැනට රජයේ කොන්ත්‍රාත් කරමින් සිටින කොන්ත්‍රාත් කරුවන් විසින් එම වැඩ සතුටුදායක අන්දමින් කෙරීගෙන යන බවට ඒවා භාර නිලධාරීන්ගෙන් ලබාගත් සහතික පත්‍ර, ටෙන්ඩර් ආකෘත පත්‍ර ඉල්ලුම් කිරීමේදී ඉදිරිපත් කළ යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී, පෙනීසිටීමට කැමති කොන්ත්‍රාත් කරුවන්, 1959ක්වූ පෙබරවාරි මස 11 වැනි දින පෙරවරු 9.30ට ඊශාන දිශාව භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමාගේ කාර්යාලයට පැමිණිය යුතුයි.

ඇස්. රාජේන්ද්‍රම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
පොලොන්නරුව,
උප කොට්ඨාශය.

1959 ජනවාරි 20 වැනි දින,
පොලොන්නරුව.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### හැනැම්මේ ඇල කැපීම

කොළඹ කොටාරෝඩිගි බස්නාහිර කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් රත්නපුර දිස්ත්‍රික්කයේ උග්ගල්කල්තොට වම් ඇල ව්‍යාපාරයේ පළමු හැනැම්මේ ඇල කැපීම සඳහා 1959 පෙබරවාරි 24 වෙනි අඟහරුවාදා පෙරවරු 11.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. රත්නපුර වාරිමාර්ග කාර්යාලයයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙක බැගින් මුද්‍රා තැබූ කවරවල බහා ඉදිරිපත් කළ යුතුයි. සැලැස්ම හා වැඩ පිළිබඳ විස්තර රත්නපුර වාරිමාර්ග කාර්යාලයයෙන් ලබා ගත හැක.

3. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 20,000ක් හෝ ඊට වැඩි මුදලකට ලියාපදිංචි වී ඇති රුපියල් 25ක් ටෙන්ඩර් සඳහා කච්චේරියේ තැන්පත් කළ බැව් පෙන්වා සිටින කොන්ත්‍රාත් කරුවනට 1959.1.30 වැනි දින සිට 1959.2.21 වැනි දින දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

දැනට රජයේ කොන්ත්‍රාත් කරමින් සිටින කොන්ත්‍රාත් කරුවන් විසින් එම වැඩ සතුටුදායක අන්දමින් කෙරීගෙන යන බවට ඒවා භාර නිලධාරීන්ගෙන් ලබා ගත් සහතිකයක් ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කිරීමේ දී ඉදිරිපත් කළ යුතුයි.

5. කරුණු නොදක්වා එකක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේ හෝ යම් ටෙන්ඩරයක යම් කොටසක් පිළිගැනීමේ හෝ අයිතිය රජය සතුයි.

කේ. බී. ඊ. ද ඇස්. කරුණාරත්න,
රත්නපුර උප කොට්ඨාශය භාර වාරිමාර්ග
ඉංජිනේරු තැන.

1959 ජනවාරි මස 13 වැනි දින,
වාරිමාර්ග කාර්යාලය, රත්නපුර.

---

## ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ආපන ශාලාව

### ආහාර පානාදිය සැපයීම

1959 මාර්තු 1 වෙනි දින සිට 1960 පෙබරවාරි 29 වෙනි දින දක්වා කාලය තුළ කොළඹ, යූනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයෙහි ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට හා සේවකයින්ට ආහාර පාන ආදිය සැපයීම සඳහා ටෙන්ඩර් 1959 පෙබරවාරි 11 වෙනි දින දවල් 12 දක්වා භාර ගනු ලැබේ.

2. ආහාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝරමවල ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකක් ලෙස පිළියෙළ කොට එක කවරයකට බහා සීල් තබා, "ආහාර කොමසාරිස් තැන, අංක 330, යූනියන් පෙදෙස, කොළඹ 2" යන ලිපිනයට එවිය යුතුයි.

3. ටෙන්ඩර් පෝරමයේ සඳහන් ආකාරයට ආහාර පානවල මිළ ගණන් සටහන් ප්‍රකාශනයක් ටෙන්ඩරයේ දිය යුතුයි.

4. ටෙන්ඩරය පිළිගත් බව දන්වා එවා දවස් 3 ක් ඇතුළත තෝරාගත් ටෙන්ඩර්කරු ඇප වශයෙන් රු. 500 ක් ආහාර කොමසාරිස් කාර්යාලයෙහි තැන්පත් කළ යුතුයි. මෙම මුදල කොන්ත්‍රාත්තුව හරියාකාර ඉටු කිරීම සඳහා ඇප මුදලක් වශයෙන් තබා ගනු ලැබේ. කොන්ත්‍රාත්තුව අනුව, යටකී කාලය තුළ තෝරාගත් ටෙන්ඩර්කරු සතුටුදායක ලෙස කොන්ත්‍රාත්තුව කරගෙන යා යුතුය. එසේ නොකළහොත් ටෙන්ඩර්කරු විසින් අලාභය ගෙවීමට සිදුවේ. යථෝක්ත කාලය තුළ කොන්ත්‍රාත්තුව සතුටුදායක ලෙස ඉටු කළ හොත් එම කාලය අවසානයේදී ඇප මුදල ආපසු දෙනු ලැබේ.

5. ආහාර පිසීම සඳහා ඉඩ පහසුකම් නැත. එහෙත් ආපන ශාලාවට අමතර වශයෙන් නව කාමරයක් දෙනු ලැබේ. කෑම පිසීම සඳහා ආපන ශාලාකරු විසින් මෙහි විධිවිධාන යොදා ගත යුතුයි.

6. ආපන ශාලාවට අයිති ගොඩනැගිල්ල හා යටකී කාමරය සඳහා කුලිය වශයෙන් මසකට රු. 60 ක් ටෙන්ඩර්කරු විසින් ගෙවිය යුතුයි. ආපන ශාලාවක් සඳහා නාගරික සභාවට ගෙවිය යුතු බලපත්‍ර කුලියද ඔහු විසින් ගෙවිය යුතුයි..

7. ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය ආහාර කොමසාරිස් තැන තමාටම වෙන්කොට තබා ගනු ලැබේ.

8. ටෙන්ඩරය පිළිගත් බව දන්වා අවශ්‍ය ඇප මුදල තැන්පත් කළ වහාම කොන්ත්‍රාත්කරු ආහාර කොමසාරිස් තැන සමඟ කොන්ත්‍රාත්තුවට බැඳිය යුතුයි. එම බැඳුම්කරයට අවශ්‍ය මුද්දර ගාස්තුව ටෙන්ඩර්කරු විසින් දැරිය යුතුයි.

කේ. එම්. ඩී. ජයනෙත්ති,
ආහාර කොමසාරිස්.

1959 ජනවාරි මස 22 දින,
කොළඹදීය.

## ආහාර දෙපාර්තමේන්තුව

වර්ෂ 1959ක් වූ මාර්තු මස 1 වෙනි දින සිට 1959ක් වූ සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා කාලය තුළ පහත සඳහන් සේවය සඳහා ටෙන්ඩර් 1959ක් වූ පෙබරවාරි මස 11 වෙනි බදාදා පස්වරු 2.30 දක්වා කොළඹ, යූනියන් පෙදෙසේ (අංක 564 දරණ තැපැල් පෙට්ටිය) ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

**සේවය.**—බුස්සේ ආහාර පාලක ගබඩාවල සිට පහත සඳහන් ප්‍රදේශයන්හි පිහිටි සපයන ස්ථානවලට සහ/හෝ සමූපකාර සංගම යන්ට ආහාර සහ කිරි පිටි ලොරිවලින් ගෙන යාම.

**ප්‍රදේශ නො : 1.**—අම්බලන්ගොඩ, ගාල්ල, වැල්ලබොඩ පත්තු, ඉඳුරුව, බස්නාහිර බෙන්තර වලල්ලාවිට කෝරළේ, හික්කඩුව, බද්දේගම යනාදි.

**ප්‍රදේශ නො : 2.**—ගාල්ල, ඇල්පිටිය යනාදි.

**ප්‍රදේශ නො : 3.**—අහංගම, වැලිගම යනාදි.

කොළඹ යූනියන් පෙදෙසේ ආහාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් 1959 පෙබරවාරි 9 වෙනි සඳුදා දවල් 12 තෙක් ලබා ගත හැකි ෆෝර්මවල ටෙන්ඩර් (පිටපත් දෙකකින්) ඉදිරිපත් කළ යුතුවේ. ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීම සඳහා ආහාර කොමසාරිස් වෙත රුපියල් 100ක් තැන්පත් කොට ලබා ගන්නා කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුවන් හැර විස්තර ප්‍රකාශනයේ 4 (ii) සහ (iii) දරණ ඡෙදයන්හි සඳහන් ලියවිලි ද ඉදිරිපත් කළ යුතුවේ. මෙම විස්තර ප්‍රකාශනයද අමතර විස්තරද ආහාර කොමසාරිස්ගේ කාර්යාලයෙන් ලබාගත හැක.

කෝ. ඇම්. ඩී. ජයනෙත්ති,
ආහාර කොමසාරිස්.

330, යූනියන් පෙදෙස,
කොළඹ.
1959 ජනවාරි මස 26 දින.

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

### ලොරි සැසිවලට බොඩි සෑදීම

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ මරදානේ තිබෙන රථවාහන අංශයට ගෙන්වන "බෙඩ්ෆෝඩ්" වර්ගයේ ටොන් තුනේ ලොරි සැසි වලට බොඩි සෑදීම සඳහා ටෙන්ඩර් 1959 මාර්තු මස 2 වැනි සඳුදා අපරභාග 2.30 දක්වා කොළඹ යූනියන් ප්ලේස්හි පිහිටි ගොවිකම් සහ ආහාර ඇමති කාර්යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් භාරගනු ලැබේ.

කොළඹ කොටුවේ චැතැම් වීථියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 300ක් බැඳ කුවිතාන්සියක් ඉදිරිපත් කර, 1959 මාර්තු මස 2 වැනි සඳුදා දවල් 12 වනතුරු ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් ෆෝරම, කොළඹ කොටුවේ චැතැම් වීථියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර ඉහත සඳහන් අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් දැනගත හැක.

ඩබ්ලිව්. ඩී. ඕ. තිලකරත්න,
අලෙවි සංවර්ධන කිරීමේ කොමසාරිස්තුමා වෙනුවට.

1959 ජනවාරි මස 23 වැනි දින,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව,
කොළඹ 1.

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

### බිත්තර ඇහිරීමට කාඩ්බෝඩ් රාක්ක සහ පියන් සැපයීම

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ මරදානේ තිබෙන "ට්‍රිපොලි" වෙළඳ සැලට බිත්තර ඇහිරීමට කාඩ්බෝඩ් රාක්ක 1,500 ක් සහ කාඩ්බෝඩ් පියන් 1,000 ක් සපයා ගෙනදීම පිණිස වුවමනා "කොටේෂන්" ඉල්ලුම් පත් කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ අලෙවි කිරීම් සංවර්ධන කොමසාරිස් තැන විසින් 1959 පෙබරවාරි මස 5 වැනි බ්‍රහස්පතින්දා සවස 2.30 දක්වා භාරගනු ලැබේ.

ඒ සඳහා වුවමනා "කෝටේෂන්" ඉල්ලුම් පත් අනුපිටපතක් ද සහිතව ලබාගැනීම 1959.2.5 වැනි දින දවල් 12.00 දක්වා වේ.

ඩබ්ලිව්. ඩී. ඕ. තිලකරත්න,
අලෙවිකිරීමේ කොමසාරිස්තුමා වෙනුවට.

1959 ජනවාරි 22 වැනි දින
කොළඹ කොටුවේ චැතැම්වීථියේ
අංක 62 දරන ස්ථානයේ පිහිටි
අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේදීය.

## වන සංරක්ෂක දෙපාර්තමේන්තුව

1959 වර්ෂය තුළදී වන සංරක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රයෝජනය සඳහා ඇට වර්ග පැළ කිරීමට කූඩා සැපයීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් පත්‍රිකා වර්ෂ 1959 පෙබරවාරි මස 10 වෙනි අඟහරුවාදා උදේ 9.30 වන තෙක් වන සංරක්ෂක තැන විසින් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍රිකා සහ වෙනත් විස්තර කුරුණෑගල, ගාල්ල, ත්‍රිකුණාමලය, කොළඹ, මඩකලපුව, යාපනය සහ නුවරඑළිය යන නගරවල පිහිටි ප්‍රාදේශීය කැලෑ කාර්යාලවලින් හෝ කොළඹ වන සංරක්ෂක කාර්යාලයෙන් හෝ ලබාගත හැක.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1959 පෙබරවාරි මස 20 වන කිවි දින පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වන වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

| පාසැලේ නම | | කළයුතු වැඩය |
|---|---|---|
| 1. කො/මාම්පේ මි. පා. | ... | පාසැල් ගොඩනැගිල්ල තැනීම. |
| 2. ක/වේරගම මි. පා. | ... | එම |
| 3. ක/නලගල මි. පා. | ... | එම |
| 4. ක/පලන්තෝරුව මි. පා. | ... | එම |
| 5. ක/වරාපිටිය ගැ. පා. | ... | පාසැල් ගොඩනැගිල්ල සහ වැසිකිළි තැනීම. |
| 6. ක/අලුත්ගම් වීදිය මුස්ලිම් පි. ජෝශප් පාසැල | | පාසැල් ගොඩනැගිලි සහ වැසිකිළි තැනීම. |
| 7. ක/නොටවත්ත දෙ. පා. | ... | පාසැල් ගොඩනැගිල්ල, ගුරු නිවාසය සහ වැසිකිළි තැනීම. |
| 8. මි/යටියන පි. පා. | ... | පාසැල් ගොඩනැගිල්ල, ගුරු නිවාසය සහ වැසිකිළි තැනීම. |
| 9. මි/තම්මිට මි. පා. | ... | පාසැල් ගොඩනැගිල්ල සහ වැසිකිළි තැනීම. |

සංලක්ෂ්‍යය : කො=කොළඹ දිස්ත්‍රික්කය.
ක=කළුතර දිස්ත්‍රික්කය.
මි=මීගමු දිස්ත්‍රික්කය.

2. අංක 1, 2, 3, 4, 5, 9 යන වැඩවලට රු. 12,500/-කට හෝ ඊට වැඩි ගණනකටද, අංක 6, 7, 8 යන වැඩවලට රුපියල් 27,500කට හෝ ඊට වැඩි ගණනකට ද ගොඩනැගිලි තැනීම සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ අංක 1, 2, 3, 4, 5, 9 යන වැඩවලට රු. 25,000කට හෝ ඊට වැඩි ගණනකටද, අංක 6, 7, 8 යන වැඩවලට රු. 45,000කට හෝ ඊට වැඩි ගණනකටද, ගොඩනැගිලි තැනීම සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිව සිටින්නාවූ ද, අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයේ (ඒ. සී. ශාඛාවේ) හෝ කොළඹින් පිට කච්චේරියක හෝ රු. 100/- මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් කොළඹ 3, බස්නාහිර පළාතේ අධ්‍යාපන නිලධාරි තැනට ඉදිරිපත් කරන්නාවූද අයට, 1959. 2. 19 වන දින පස්වරු 3.30 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. චෙක්පත්, මනි ඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන අවස්ථාවේදී දැනට රජයේ යටතේ ඇති කොන්ත්‍රාත් සම්බන්ධව පහත සඳහන් පරිදි සහතිකයක් ටෙන්ඩර්කරුවන් විසින් ඉදිරිපත් කළ යුතුයි:—

වැඩයේ නම :————.
කොන්ත්‍රාත්තුවේ දිනය :————.
කොන්ත්‍රාත්තුවේ මුළුගණන :————.
වැඩය අවසාන කිරීමට නියමිත දිනය (කල් දීම් ඇතිව) :————.
වැඩය සතුටුදායකද අසතුටුදායකද යන වග :-————.
දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ප්‍රධාන තැනගේ අත්සන :————.

ඉහත සඳහන් වන්නේ මවිසින්/අප විසින් කොන්ත්‍රාත් ගෙන තිබෙන සියලුම වැඩවල සම්පූර්ණ විස්තරයන් බැව් සහතික කරමි/කරමු.

————,
ටෙන්ඩර්කරුගේ අත්සන.

දිනය :————.

4. ටෙන්ඩර්කරුවන් විසින් පූර්වෝක්ත තුන්වන (3) ඡෙදයේ අසා තිබෙන විස්තර පිළිබඳ සම්පූර්ණ සත්‍යය සඟවා ප්‍රකාශ කිරීම කොන්ත්‍රාත්තුවක් ඕනෑම අවස්ථාවක අවලංගු කිරීමට ප්‍රමාණවත් වන බැව් සැළකිය යුතුයි.

5. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් (එස්. ඩබ්ලිව්. ශාඛාවෙන්) හෝ බස්නාහිර පළාතේ අධ්‍යාපන නිලධාරි තැනගෙන් ලබාගත යුතුය. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරනු ලබන්නේ දෙවන ඡෙදයේ සඳහන් වන මුදල් ප්‍රමාණයට ලියාපදිංචිව ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණකි.

කම්කරුවන් හා ටැන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන්ම පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටැන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ, සේවයේ යෙදීමට අධ්‍යාපනාමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ සම්මතිය ඇතිව අධ්‍යාපනාධ්‍යක්ෂවරයා විසින් අවසර දී ඇති විශේෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහත කී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩ කළා සේ සලකනු ලැබීමට ද, කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමට ද යටත් වේ. ලාංකික නොවූ හෝ ටැන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහතකී අනුමතිය හෝ සම්මතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

ඩබ්ලිව්. ඇම්. ඒ. වර්ණසූරිය,
බ. ප. අධ්‍යාපන නිලධාරි තැන.

1959 ජනවාරි මස 27 වැනි දින,
කොළඹ 3, බ. ප. අධ්‍යාපන කාර්යාලයේදීය.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### ඉංග්‍රීසි පාඨශාලා පොත් සැපයීම—1958-59

ඉංග්‍රීසි පාඨශාලා පොත් සැපයීම සඳහා 1959 පෙබරවාරි 20 වැනි කිවිදින පස්වරු 2.30 වන තෙක්, කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, ටැන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටැන්ඩර් පත්‍ර එවීමට බලාපොරොත්තුවන අය විසින් විස්තර ලේඛන ඉල්ලා සිටිවිට, අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙනුවෙන් කොළඹ 2, මලයිවීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ බඩුබාහිරා සැපයීමේ ශාඛාව විසින් ඒවා ඔවුනට නොමිළයේ සපයනවා ඇත.

3. කොළඹ ටැන්ඩර්කරු භවතුන් විසින් අධ්‍යාපනාධ්‍යක්ෂ තැනනමට කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඒ.සී. ශාඛාවේද, කොළඹින් පිට අය විසින් කොළඹින් පිට ඕනෑම කච්චේරියකද රු. 100 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළවිට 1959 පෙබරවාරි මස 19 වැනි දින තෙක් සාමාන්‍ය රාජකාරි කාලය තුළදී ටැන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

එල්. ඩී. එස්. කරුණාරත්න,
අධ්‍යාපනාධ්‍යක්ෂ වෙනුවට.

1959 ජනවාරි මස 27 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### දෙමළ පාඨශාලා පොත් සැපයීම—1958-59

දෙමළ පාඨශාලා පොත් සැපයීම සඳහා 1959 පෙබරවාරි 20 වැනි කිවිදින පස්වරු 2.30 වන තෙක්, කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, ටැන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටැන්ඩර් පත්‍ර එවීමට බලාපොරොත්තුවන අය විසින් විස්තර ලේඛන ඉල්ලා සිටිවිට, අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙනුවෙන් කොළඹ 2, මලයිවීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ බඩුබාහිරා සැපයීමේ ශාඛාව විසින් ඒවා ඔවුනට නොමිළයේ සපයනවා ඇත.

3. කොළඹ ටැන්ඩර්කරු භවතුන් විසින් අධ්‍යාපනාධ්‍යක්ෂ තැනනමට කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඒ.සී. ශාඛාවේද, කොළඹින් පිට අය විසින් කොළඹින් පිට ඕනෑම කච්චේරියකද රු. 100 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළවිට 1959 පෙබරවාරි මස 19 වැනි දින තෙක් සාමාන්‍ය රාජකාරි කාලය තුළදී ටැන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

එල්. ඩී. එස්. කරුණාරත්න,
අධ්‍යාපනාධ්‍යක්ෂ වෙනුවට.

1959 ජනවාරි මස 27 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1959 පෙබරවාරි මස 20 වැනි කිවි දින පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වන වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ :—

| පාසලේ නම | කළයුතු වැඩය |
| --- | --- |
| (1) මා/ගතාරේ රජයේ විද්‍යාලය | පාසැල් ගොඩනැගිලි |
| (2) මා/පුවක්ගහහේන රජයේ විද්‍යාලය | පාසැල් ගොඩනැගිලි |
| (3) මා/මීද්දෙනිගොඩ රජයේ විද්‍යාලය | පාසැල් ගොඩනැගිලි |
| (4) මා/අත්තුඩාව රජයේ විද්‍යාලය | පාසැල් ගොඩනැගිලි |

සංලක්ෂය :—මා = මාතර දිස්ත්‍රික්කය.

2. ඉහත සඳහන් පළමුවන, තුන්වන සහ සතරවන වැඩ සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රු. 15,000 කට හෝ ඊට වැඩි ගණනකට ද ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රු. 30,000 කට හෝ ඊට වැඩි ගණනකටද, දෙවන වැඩය සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ රු. 20,000 කට හෝ වැඩි ගණනකට ද, ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුවේ රු. 40,000 කට හෝ වැඩි ගණනකට ද ලියා පදිංචි වී සිටින, අධ්‍යාපන අධ්‍යක්ෂතැනගේ කාර්යාලයේ (ඒ. සී. ශාඛාවේ) හෝ කොළඹින් පිට කච්චේරියක හෝ රු. 100ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් දකුණු පළාතේ අධ්‍යාපන නිලධාරිතැනට ඉදිරිපත් කරන්නාවූද අයට 1959 පෙබරවාරි මස 19 වැනිදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරණු ලැබේ. චැක් පත්, මනිඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාර ගනු නොලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන අවස්ථාවේදී දැනට රජය යටතේ ඇති කොන්ත්‍රාත් සම්බන්ධව පහත සඳහන් පරිදි සහතිකයක් ටෙන්ඩර්කරුවන් විසින් ඉදිරිපත් කළයුතුයි :—

| වැඩයේ නම | කොන්ත්‍රාත්තුවේ දිනය | කොන්ත්‍රාත්තුවේ මුළු ගණන | වැඩය අවසාන කිරීමට නියමිත දිනය (කල් දීම් ඇතිව) | වැඩය සතුටු දයකද අසතුටු දයකද යන වග | දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ප්‍රධාන තැනගේ අත්සන |
| --- | --- | --- | --- | --- | --- |

ඉහත සඳහන් වන්නේ මවිසින්/අප විසින් කොන්ත්‍රාත් ගෙන තිබෙණ සියලුම වැඩ වල සම්පූර්ණ විස්තරයක් බව සහතික කරමි/කරමු.

____________.
ටෙන්ඩර්කරුගේ අත්සන.

දිනය :————.

4. ටැන්ඩර්කරුවන් විසින් පූරුවෝක්ත තුන්වන (3) ඡේදයේ අසා තිබෙණ විස්තර පිළිබඳ සම්පූර්ණ සත්‍ය සඟවා ප්‍රකාශ කිරීම කොන්ත්‍රාත්තුවක් ඕනෑම අවස්ථාවක අවලංගු කිරීමට ප්‍රමාණවත් විත බැව් සැලකිය යුතුයි.

5. ටැන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්ෂතැනගේ (එස්. ඩබ්ලිව්. ශාඛාවෙන්) හෝ දකුණු පළාතේ අධ්‍යාපන නිලධාරිතැනගෙන් ලබා ගත යුතුයි. මුදල් ගෙවීමේ පත්‍ර නිකුත් කරණු ලබන්නේ 2 වැනි ඡේදයේ සඳහන්වන මුදල් ප්‍රමාණයට ලියා පදිංචිවී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කරණ අයට පමණකි.

6. පූර්වෝක්ත 2 වෙනි ඡේදය් සඳහන්වන පරිදි අධ්‍යාපන නිලධාරිතැනගෙන් ලබාගත් ටෙන්ඩර් ෆෝරම එවිය යුත්තේ දෙවෙනි පිටපතකුත් සමගය. සියලුම විස්තර හා තොරතුරු දකුණු පළාතේ අධ්‍යාපන නිලධාරිතැනගෙන් දැනගත හැකිය. සැලැස්ම එහිදී බලාගත හැකිය. තැපැලෙන් එවන ටෙන්ඩර් පත්‍ර "ටෙන්ඩර් සභාවේ සභාපති, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මැලේ වීදිය, කොළඹ 2" යන ලිපිනයට රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුය. ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවන් විසින් ටැන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් නොඑවන්නේ නම් ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාර නිලධාරිතැනට භාරදී, එසේ භාරගත් බවට එකෙනෙහිම ලියවිල්ලක් ලබා ගත යුතුයි. එසේ භාරදෙන ටෙන්ඩර් පත්‍රය බහා ඇති කවරයේ ටෙන්ඩර්කරුගේ නමද, ලිපිනයද, වැඩෙහි නමද ලියා තිබිය යුතුයි.

7. 1959 පෙබරවාරි මස 20 වෙනි කිවිදින පස්වරු 2.30ට කොළඹ, මැලේ වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරණු ලැබේ. ටෙන්ඩර් විවෘත කරනවිට ටෙන්ඩර්කරුවන්ට විවෘත කරනුලබණ ස්ථානයෙහි සිටීමට අවසර දෙනු ලැබේ. තවද, ටෙන්ඩර් විවෘත කරණුලබණ නිලධාරිතැන විසින් ගාස්තු ප්‍රමාණයද (රේට් ගණන් ද) ටෙන්ඩර් කරුවන්ගේ නම්ද පැමිණ සිටින අයට ඇසෙනසේ කියවනවා ඇත.

8. ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන්ගේ ටෙන්ඩර් පත්‍ර භාරගැණීම අවසන් කර සතිහයකට නොඅඩු කාලයක් තුල සවකීය ගණන් යෝජනා විවෘතව තැබිය යුතුයි.

9. වෙනත් අවශ්‍ය විස්තර දකුණු පළාතේ අධ්‍යාපන නිළධාරි තැනගෙන් ලබාගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලිද මෙහිදී පරීක්ෂා කර බැලිය හැක.

10. තෝරාගනු ලැබූ ටෙන්ඩර් කරුවන් විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නුපුහුණු හෝ වේවා ලාංකික කම්කරුවන්ය. ටෙන්ඩරයට අයත් වැඩය කරණු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටැන්ඩරයට අයත් වැඩය කරණු ලබන ප්‍රදේශයේ කම්කරුවන්ම පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කරණු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරණු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ සේවයේ යෙදීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ සථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇතිව අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් අවසරදී ඇති විශෙෂ අවසථාවන්හිදී හැර අන් සැම විටම ඉහත කී කොන්දේසි නොපිළිපැදීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළ සේ සලකණු ලැබීමටද, කොන්ත්‍රාත්තුව අවළංගු කරණු ලැබීමටද යටත් වේ. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරණු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහතකී අනුමැතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

ඇම්. බී. නූර්දීන්,
දකුණු පළාතේ අධ්‍යාපන නිළධාරිතැන

1959 ජනවාරි 26 වැනි දින,
ගාල්ලේ අධ්‍යාපන කායසීලයේදිය.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1959 පෙබරවාරි මස 20 වැනි කිවී දින පස්වරු 2.30 වන තෙක් පහත සඳහන් වන වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ අධ්‍යාපන කායසීලයේ ටැන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ:—

| පාසලේ නම | කළයුතු වැඩය |
|---|---|
| 1. මා/බෙන්ගමුව රජයේ විද්‍යාලය | හදිසි අළුත් වැඩියා කිරීම |
| 2. මා/බටුවිට රජයේ විද්‍යාලය ... | වහල අළුත් වැඩියා කිරීම |
| 3. මා/මොරවක මහා විද්‍යාලය ... | සෙල්ලම් පිට්ටනිය |
| 4. මා/දික්වැල්ල මධ්‍යම මහා විද්‍යාලය ... | සෙල්ලම් පිට්ටනිය |
| 5. මා/වරල්ල රජයේ විද්‍යාලය ... | ගොඩනැගිලි |
| 6. ගා/කතළුව මහා විද්‍යාලය ... | සෙල්ලම් පිට්ටනිය |
| 7. ගා/නාගොඩ මහා විද්‍යාලය ... | සෙල්ලම් පිට්ටනිය |
| 8. ගා/මාලමුරේ රජයේ විද්‍යාලය ... | ගොඩනැගිලි |
| 9. හ/ගලගම රජයේ විද්‍යාලය ... | හදිසි අළුත් වැඩියා කිරීම |
| 10. හ/හුන්ගම රජයේ විද්‍යාලය ... | ග්‍රා. සං. ස. ගොඩනැගිල්ල, ඉතිරි වැඩ |

සංලක්ෂ්‍යය : ගා = ගාලු දිස්ත්‍රික්කය
මා = මාතර දිස්ත්‍රික්කය
හ = හම්බන්තොට දිස්ත්‍රික්කය

2. ඉහත සඳහන් පළමුවන, දෙවන, තුන්වන, සතරවන, හයවන, සත්වන, නවවන සහ දසවන වැඩ සඳහා අධ්‍යාපන දෙපාතීමේන්තුවේ රු. 5,000කට හෝ ඊට වැඩි ගණනකටද ප්‍රසිඛ වැඩ දෙපාතීමේන්තුවේ රු. 10,000 කට හෝ ඊට වැඩි ගණනකට ද පස්වන සහ අටවන වැඩ සඳහා අධ්‍යාපන දෙපාතීමේන්තුවේ රු. 7,500කට හෝ වැඩි ගණනකට ද ප්‍රසිඛ වැඩ දෙපාර්තමේන්තුවේ රු. 15,000කට හෝ වැඩි ගණනකට ද ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී සිටින අධ්‍යාපන අධ්‍යක්ෂතැනගේ කායසීලයේ (ඒ. සී. ශාඛාවේ) හෝ කොළඹින් පිට කච්චේරියක හෝ රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් දකුණු පළාතේ අධ්‍යාපන නිළධාරිතැනට ඉදිරිපත් කරන්නාවූද අයට 1959 පෙබරවාරි මස 19 වැනි දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරණු ලැබේ. චැක් පත්, මනි ඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාර ගනු නොලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන අවසථාවේදී දැනට රජය යටතේ ඇති කොන්ත්‍රාත් සම්බන්ධව පහත සඳහන් පරිදි සහතිකයක් ටෙන්ඩර්කරුවන් විසින් ඉදිරිපත් කළයුතුයි.

| වැඩයේ නම | කොන්ත්‍රාත්තුවේ දිනය | කොන්ත්‍රාත්තුවේ මුළු ගණන | වැඩය අවසාන කිරීමට නියමිත දිනය (කල් දීම ඇතිව) | වැඩය සතුටු දයකද අසතුටු දයකද යන වග | දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ප්‍රධාන තැනගේ අත්සන |
|---|---|---|---|---|---|

